# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2157/29 - 2020 ජනවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2020.01.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

### නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වැනි ව්‍යවස්ථාවට අනුකූලව, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අදාළ වන රාජ්‍ය අමාත්‍යවරුන් වෙත වෙන් කර දෙනු ලබන විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන මෙම නිවේදනයේ දිනයේ සිට මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් පරිදි වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජනක බණ්ඩාර තෙන්නකෝන් (පා.ම.),
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2020 ජනවාරි මස 04 වැනි දින,
කොළඹ 07, නිදහස් චතුරස්‍රයේ,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ දී.

### උපලේඛනය

**1. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූවන් ගේ සුභසාධනය හා ආරක්ෂණය සඳහා විශ්‍රාම වැටුප් සංග්‍රහය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම.<br>2. රජයේ සියලුම විශ්‍රාම වැටුප් ක්‍රම සම්බන්ධ කටයුතු.<br>3. උපත්, විවාහ හා මරණ ලියාපදිංචියට අදාළ කටයුතු.<br>4. ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා ඒ හා සම්බන්ධ කටයුතු. | 1. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව<br>2. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව<br>3. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව<br>4. රාජ්‍ය භාෂා කොමිසම<br>5. භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය<br>6. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව<br>7. රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල | • වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත (1983 අංක 24)<br>• වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ආඥාපනත (1898 අංක 1)<br>• වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත (1998 අංක 60)<br>• වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත (1970 අංක 18) |

1A - G 31778 — 370 (2020/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| | | • රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල ආඥාපනත (1942 අංක 18)<br>• රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදල පනත (1999 අංක 40)<br>• උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1951 අංක 17)<br>• උඩරට විවාහ හා දික්කසාද පනත (1952 අංක 44)<br>• මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (1951 අංක 13)<br>• නොතාරිස් ආඥාපනත (1907 අංක 1)<br>• ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1927 අංක 23)<br>• සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (1907 අංක 19)<br>• රාජ්‍ය භාෂා පනත (1956 අංක 33)<br>• රාජ්‍ය භාෂා කොමිසම පනත (1991 අංක 18)<br>• රාජ්‍ය භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය පනත (2007 අංක 26)<br>• ජාතික මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනත (1997 අංක 18) |

**2. රාජ්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. රාජ්‍ය සේවා පුහුණුව.<br>2. අපේක්ෂිත සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම පිණිස රාජ්‍ය තන්ත්‍රය තුළ කාර්යක්ෂම සහ ඉහළ ගුණත්වයෙන් යුත් ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම.<br>3. ගෝලීය අභියෝගයන්ට මුහුණදීමට අවශ්‍ය වන්නා වූ හැකියාවන්ගෙන් යුත් රාජ්‍ය සේවයක් ඇති කිරීම පිණිස නවීන තාක්ෂණ ක්‍රමෝපායන් යොදා ගනිමින් රාජ්‍ය සේවයේ පුහුණු ක්‍රමවේදයන් යාවත්කාලීන කිරීම. | 1. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය<br>2. ඩිස්ටන්ස් ලර්නිං සෙන්ටර් ලිමිටඩ්<br>3. මිලෝදා ආයතනය (Academy of Financial Studies) | • ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනත (1982 අංක 9) |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**2. රාජ්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 4. නව ආර්ථික හා සමාජ ප්‍රවණතාවයන් හමුවේ රාජ්‍ය සේවය ශක්තිමත් කිරීම සඳහා උචිත වන ලෙස පුහුණු පාඨමාලා නවීකරණය කිරීම. | | |
| 5. රාජ්‍ය ආයතනවල ඵලදායීතාවය හා කාර්යසාධනය ඉහළ නැංවීම පිණිස නවීන තාක්ෂණික ක්‍රමවේදයන් යොදා ගනිමින් සහ අදාළ ආයතන සමග සම්බන්ධීකරණයෙන් වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම. | | |

01 - 592

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.